# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 14,727/3 — 1966 දෙසැම්බර් 24 වැනි සෙනසුරාදා — 1966.12.24**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

**යා/ක්‍රිස්තියානි විද්‍යාලය, කෝපායි**

1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වෙනි වගන්තිය යටතේ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් කරනු ලබන නියෝගයයි.

ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික ඇමති.

ජපාඅඋ/495
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
මැලේ වීදිය, කොළඹ 2,
1966 දෙසැම්බර් මස 20 දින දීය.

**නියෝගය**

කෝපායි හි, යා/ක්‍රිස්තියානි විද්‍යාලය සම්බන්ධයෙන් 1962 වර්ෂයේ දෙසැම්බර් මාසයේ 11 වෙනි දින අංක 13,429 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ 1962 වර්ෂයේ දෙසැම්බර් මාසයේ 6 වෙනි දින අංක 2314 දරන පැවරුම් නියෝගය, එහි උපලේඛනයෙහි 1 වෙනි ඡේදය වෙනුවට මතු දැක්වෙන ඡේදය යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"1. කෝපායි හි, යා/ක්‍රිස්තියානි විද්‍යාලය 1960 වර්ෂයේ ජූලි මාසයේ 21 වෙනි දින පවත්වනු ලැබුවාවූත්, නඩත්තු කරනු ලැබුවාවූත් ස්ථානය, එනම්:—උතුරු පළාතේ, වලිගාමම් නැගෙනහිර ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ කෝපායිහි පිහිටියාවූත්; උතුරින්: කේ. වෙල්ලයියා, කේ. වේලුපිල්ලේ, පිචඩ් තෝනා මහත්මිය යන අය අයිතිවාසිකම් කියන ඉඩම්වලින් හා පිචඩ් තෝනා මහත්මියගේ වත්තට යන පටු මාවතින්ද; නැගෙනහිරින්: බලය ලත් මිනින්දෝරු හා වට්ටම්කරු එන්. තාම්පු මහතා විසින් සකස් කරන ලද අංක 1096B හා 65.5.4 දින දරණ පිඹුරේ දක්වා ඇති අයුරු ප්‍රදේශය භාර දෙවගැති තැනගේ නිවාසය හා දේවස්ථානය පිහිටි භූමිභාගයෙන්, පේද්‍රුරුතුඩුව-යාපනය මහා මාර්ගයෙන් හා එකී එන්. තාම්පු මහතා විසින් සකස් කරන ලද අංක 1096A දරණ පිඹුරේ අංක 3 කට්ටිය වශයෙන් දක්වා ඇති සුසාන භූමියෙන්ද; දකුණින්: නගුලෙස්වර සහ සුබ්‍රමානියම් මහත්මිය අයිතිවාසිකම් කියන ඉඩම්වලින්ද; බස්නාහිරින්: නගුලේස්වර, ඇස්. සිනියර්, ඇන්. තාම්බර්, ඇස්. සින්නාඩියාර් හා සින්නතම්බි අයිතිවාසිකම් කියන ඉඩම්වලින්ද, මායිම්වූත් ප්‍රමාණයෙන් වී. සී. ලච්චිස් අනූදෙකක් පමණ විශාල වූත් ඉඩම් කොටස සම්පූර්ණයෙනි. එකී අංක 1096A දරණ පිඹුරේ අංක 5 කට්ටිය වශයෙන් හඳුන්වා ඇති අඩිපාර ඔස්සේ එකී පේද්‍රුරුතුඩුව-යාපනය මහා මාර්ගයේ සිට සුසාන භූමියට යෑමේ ඊමේ බලය දෙනු ලැබේ."

12-1369/1

### 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

**10 වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය**

**නු/ශාන්ත ෂේවියර් විද්‍යාලය, නුවරඑළිය**

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය තැන්පත් ඉම්යා මුදියන්සේලාගේ රපියෙල් අභයවංශ ඊරියගොල්ල වන මම, 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 10 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියා කරමින්, 1962 වර්ෂයේ නොවැම්බර් මාසයේ 10 වැනි දින අංක 13,389 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ අංක 1102 අ දරණ පැවරුම් නියෝගය, මෙහි පහත සඳහන්වන උපලේඛනයෙහි විස්තර කොට දැක්වෙන දේපලවලට අදාලවනතාක් දුරට 1962 වර්ෂයේ දෙසැම්බර් මාසයේ 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

පාප/16/ජපාඅක 174
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
මැලේ වීදිය, කොළඹ 2.
1966 දෙසැම්බර් මස 20 දින දීය.

**උපලේඛනය**

1. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය නගරයේ පිහිටියාවූත්,

උතුරෙන්: මැක්ලම් ආයසී පාරෙන්ද;

නැගෙනහිරෙන්' මැක්ලම් ආයසී පාරෙන්ද;

දකුණෙන්: හරස් වීදියෙන්ද, මෙම මායිමේ දිග අඩි 152 කි.

බටහිරෙන්: දකුණු මායිමේ බටහිර කෙළවරින් ආරම්භව ඊට සෘජු කෝණාශ්‍රව සිටින සේ අඩි 51ක් උතුරට විහිදී එතැන් සිට ඊට සෘජු කෝණාශ්‍රව සිටිනසේ අඩි 34ක් නැගෙනහිර දෙසට විහිදී එම ලක්ෂ්‍යයේ සිට ඊට සෘජු කෝණාශ්‍රව සිටිනසේ අඩි 17ක් උතුරු දෙසට විහිදී එම ලක්ෂ්‍යයේ සිට නැවත වරක් අඩි 28ක් නැගෙනහිර දෙසට විහිදී නැවත අඩි 72ක් උතුරට විහිදී, උතුරු මායිම හමුවන රේඛාවකින් මායිම්වූ, ඇස්. වඩිවේළු, ආර්. සුප්පයියා සහ එමානිස් සිල්වා යන අය විසින් අයිතිවාසිකම් කියනු ලබන ඉඩම්වලින්ද මායිම්වූත් ඉඩම් කොටස සම්පූර්ණයෙනි.

2. මෙම උපලේඛනයේ 1 වැනි ඡේදයේ වෙසෙසා දැක්වෙන ඉඩමේ පිහිටි ගොඩනැගිලි හා නිර්මාණයන් සියල්ලම.

12-1369/2

1052/21——එච 133—11,100 (66/12)

## 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### 10 වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

### නු/ශාන්ත ෂේවියර් විද්‍යාලය, නුවරඑළිය

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය තැන්පත් ඉමියා මුදියන්සේලාගේ රපියෙල් අභයවංශ ඊරියගොල්ල වන මම, 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 10 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියා කරමින්, 1962 වර්ෂයේ මාර්තු මාසයේ 28 වැනි දින අංක 12,998 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ අංක 1102 දරණ පැවරුම් නියෝගය, මෙහි පහත සඳහන් වන උප ලේඛනයෙහි විස්තර කොට දක්වෙන දේපොල වලට අදාලවනතාක් දුරට 1962 වර්ෂයේ අප්‍රේල් මාසයේ 15 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

පාප/16/ජපාඅක 174
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
මැලේ වීදිය, කොළඹ 2, 1966 දෙසැම්බර් 20 දින දිය.

#### උපලේඛනය

1. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළිය නගරයේ පිහිටියාවූත්,

උතුරෙන් හා නැගෙනහිරෙන් : කන්‍යාරාම තාප්පයෙන් ද ;

දකුණෙන් : සේවක නිවාසයේ දකුණු බිත්තියට අඩි 10 අඟල් 9 ක් දකුණෙන් ඊට සමාන්තරව වූ රේඛාවකින් ද ;

බටහිරෙන් : සේවක නිවාසයේ බටහිර බිත්තියට අඩි 4ක් බටහිරෙන් ඊට සමාන්තරව වූ රේඛාවකින් ද, මායිම්වූත් ඉඩම් කොටස සම්පූර්ණයෙනි.

2. මෙම උපලේඛනයේ 1 වැනි ඡේදයේ වෙසෙසා දක්වෙන ඉඩමේ පිහිටි ගොඩනැගිලි හා නිර්මාණයන් සියල්ලම.

12-1369/3

---

## 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### 10 වෙනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

### ගා/බද්දේගම ක්‍රිස්ට්චර්ච් බාලිකා ඉංග්‍රිසි පාසැල
### ගා/ක්‍රයිස්චර්ච් පිරිමි ඉංග්‍රිසි පාසල සහ
### ගා/බද්දේගම (ලංකා සභා) සිංහල මිශ්‍ර පාසල, බද්දේගම

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය තැන්පත් ඉමියා මුදියන්සේලාගේ රපියෙල් අභයවංශ ඊරියගොල්ල වන මම, 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 10 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියා කරමින්, 1962 වර්ෂයේ අගෝස්තු මාසයේ 10 වෙනි දින අංක 13,258 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ වූ අංක 1667 දරණ පැවරුම් නියෝගය, මෙහි පහත සඳහන් වන උපලේඛනයෙහි විස්තර කොට දක්වෙන දේපළවලට අදාළ වනතාක් දුරට 1962 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

පාප/16/ජ.පා.ආ.එ. 11
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
මැලේ වීදිය, කොළඹ 2,
1966 දෙසැම්බර් මස 20 වැනි දින.

#### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගඟබොඩ පත්තුවේ බද්දේගම පිහිටියාවූත්, බලය ලත් මැනුම්කරුවන පී. වීරසිංහ මහතා විසින් සාදන ලද අංක 572 හා 66.11.1 දින දරණ පිඹුරේ " ඒ " ඉඩම් කැබැල්ල වශයෙන් දක්වා ඇති පාම්හිල් නැමැති ඉඩමේ කොටසක් වශයෙන් හැඳින්වෙන්නාවූත්

උතුරෙන් හා නැගෙනහිරෙන් : ඉහත කී අංක 572 හා 66.11.1 දින දරන සැලැස්මේ දක්වා ඇති මීගහවත්තෙන් හා ගල් වැටියෙන් ද ;

දකුණෙන් : ඉහත කී අංක 572 හා 66.11.1 දින දරණ පිඹුරේ දක්වා ඇති මෙම ඉඩමේම කොටසකින් ද ;

බටහිරෙන් : ඉහත කී අංක 572 හා 66.11.1 දින දරන පිඹුරේ දක්වා ඇති පාරෙන් ද මායිම් වූත් පාර්චස් විසිහතයි දසම පහක් (අ. 0, රූ. 0, පා. 27.5) විශාල වූත් ඉඩම් කොටස සම්පූර්ණයෙනි.

2. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගඟබොඩ පත්තුවේ බද්දේගම පිහිටියාවූත්, බලය ලත් මැනුම්කරු වන පී. වීරසිංහ මහතා විසින් සාදන ලද අංක 571 හා 66.11.1 දින දරන පිඹුරේ " ඒ " ඉඩම් කැබැල්ල වශයෙන් දක්වා ඇති චර්ච්හිල් නමින් හැඳින්වෙන්නාවූත්

බටහිරෙන් හා උතුරෙන් : ඉහත කී අංක 571 හා 66.11.1 දින දරන පිඹුරේ දක්වා ඇති බද්දේගම සිට ඇතුමලේට යන පාරෙන් ද ;

නැගෙනහිරෙන් : ඉහත කී අංක 571 හා 66.11.1 දින දරන පිඹුරේ දක්වා ඇති මෙම ඉඩමේම කොටසකින් ද ;

දකුණෙන් : ඉහත කී අංක 571 හා 66.11.1 දින දරන පිඹුරේ දක්වා ඇති පල්ලියට යන පාරෙන් ද මායිම්වූත් පාර්චස් එකොළහයි දසම හයයි දෙකයි පහක් (අ. 0, රූ. 0, පා. 11.625) විශාල වූත් ඉඩම් කොටස සම්පූර්ණයෙනි.

3. මෙම උප ලේඛනයේ 1 හා 2 යන ඡේදයන්හි වෙසෙසා දක්වෙන ඉඩම්වල පිහිටි ගොඩනැගිලි හා නිර්මාණයන් සියල්ලම.

12-1369/4

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි